


# මිදුලේ වැලි මාළිගාව

පසුගිය දා මෙල්බන් නුවර පැවැත්වුණා " ආදරණීය රෝහණ" ප්‍රසංගය කුඩා දරුවන්ට විශේෂ වූ ප්‍රසංගයක් වුණා. ආචාර්ය රෝහණ වීරසිංහයන්ගේ මුල්ම ළමා ගී එකතුව "මිදුලේ වැලි මාලිගාව" සංයුක්ත තැටිය එදා " ආදරණීය රෝහණ" ප්‍රසංග වේදිකාවේ එළි දැක්වීමයි ඒ. ඇත්තට ම මේ තරම් ප්‍රමාණයක් ආචාර්ය රෝහණ වීරසිංහයන් දරුවන් වෙනුවෙන් නිර්මාණය කර ඇති බව කවුරු වුණත් දැනුවත් වුණේ ඒ රැයේදීයි.



සිසිර දිසානායක


මේ පිළිබඳව ආචාර්ය රෝහණ වීරසිංහයන් සමඟ පිළිසඳරක යෙදෙන්නට සිතුවේ කලකින් " ගී සඳළුව" වෙනුවෙන් වීරසිංහයන් ව සම්බන්ධ කරගැනීමටත් නොහැකි වූ නිසයි. තමන්ගේ ගී එකතුව ඕස්ට්‍රේලියාවේදීම, එළි දක්වන්නට අදහස් කිරීමටත් විශේෂ හේතුවක් ඇති කියලයි අප සිතන්නේ.

"මෙහෙමයි...... රෝහණ වීරසිංහයන් සමඟ කතාවට එක් වුණා. ඉස්සර වෙලා ම මම කරපු ළමා ගීතය අතිශයින් ම ජනප්‍රිය වුණා. ඒ අසූවේ දශකයේ මුල් කාලයේ. ඒ කාලේ ඉස්කෝලේ යන ළමයෙක් තමයි මේ ගීතය ගැයුවේ. නම පේෂලා මෙන්ඩිස්. ඒ ගීතය තමයි "මිදුලේ වැලි මාලිගාවේ සක්විති පදවිය ලබන්න" ගීතය. ඒ වගේ ම ඊට පස්සේ ප්‍රියංකා වීරසේකර කියන දුව ගායනා කරපු "චූටි කුරුල්ලනි, චූටි පැටික්කනි" කියන ළමා ගීතයත් ඒ වගේම ජනප්‍රිය වුණා. ඇත්තටම ඒ කාලයේ මාධ්‍ය සුභායික ගීතයට කරපු සැළකිල්ල නිසා තමයි ඔය ළමා ගීත පවා ජනප්‍රිය වුණේ. ඇත්තටම ඒ මාධ්‍යවලින් දුන්න සහයෝගය ගැන හිතනකොට හරිම සතුටක් ඇති වෙන්නෙ........"

ඇත්තට ම ආචාර්ය රෝහණ වීරසිංහයන් සඳහන් කළ ඒ ළමා ගී අපට තාමත් මතකයි.

"ඉතින් ඊට පස්සේ ඔය රූපවාහිනී මාධ්‍යයට එහෙම කරපු "මොනවද මුත්තේ - මොකද කරන්නේ ?" වාගේ ගීතත් හැම එකක් ම හොඳින් ජනප්‍රිය වුණා."

"ඔය අතරෙයි සෝමරත්න දිසානායක මහත්මා ළමයින් වෙනුවෙන් ම චිත්‍රපටි මාලාවක් කරන්න පටන් ගත්තේ. ඒ හැම චිත්‍රපටයක ම ප්‍රධාන ගීතයකට අවස්ථාව දුන්නා. ඔය අතරින් "සූරිය අරණ" චිත්‍රපටියේ තේමා ගීතය "ඉරෙන් හඳෙන් " ගීතය තරමට ජනප්‍රිය වුණ ළමා ගීතයක් නැති තරම්. ඒකට ඒ චිත්‍රපටියේ දර්ශනත් බලපෑවා. ඊට පස්සේ ඒ මහත්මයා - කරපු ළමා චිත්‍රපට තමයි සමනළ තටු, පුංචි සුරංගනාවක්, සිරි පැරකුම්, සිරි රජ සිරි" වාගේ චිත්‍රපට. මේ චිත්‍රපටත් ජනප්‍රිය වුණා. ඒ වගේ ම ඒ චිත්‍රපටිවල තිබුණ ගීතත් ජනප්‍රිය වුණා. ඒ




වගේ ම ළමා ටෙලි නාට්‍යවලට තිබුණ ගීතත් ජනප්‍රිය වුණා. ඒ වගේ ම ළමා ටෙළිනාට්‍යවලට කරපු ගීතත් රසිකයින්, ළමයින් අතට ගියා....."


ඒ ආචාර්ය රෝහණ වීරසිංහයන්ගේ ළමා ගී අතීතයෙන් බිඳක්. සංගත තැටියේ කවරයේ පිට පැත්ත බැළුවොත් වීරසිංහයන් ළමා ගීත නිර්මාණය කළ ටෙලි නාට්‍ය කීපයක් ගැන මතක් කරගන්න පුළුවන්. "මුතු පිහාටු", "ජීවිතය ලස්සනයි", "ටිකිරි සුවඳ" ටෙලි නාට්‍ය ඒ අතරින් කීපයක්. ඉතින් මේ ළමා ගීත මේ විදියට එකතු වුණේ කොහොමද ?

"මට හිතුණා අර චිත්‍රපට ගීත එකතු තුනක් කළා වගේ ළමා ගීත එකතුවක් කරන්න. ඇත්තට ම මේ ගීත තැනින් තැන විසිරිලයි තිබුණෙ. කල් ගියා මේ ටික එක් කරගන්න. ඉතින් මෙල්බන් ෂෝ එකට රන්න කිට්ටුව තමයි සංගත තැටිය සම්පූර්ණ කරගන්න පුළුවන් වුණේ. ඉතින් මම හිතුවා ඒ වේදිකාවේදීම මේ සංගත තැටිය එළි දක්වන්න. මොකද හුඟක් ඉස්කෝලවල විවිධ ප්‍රසංගවල මේ ගීතවලට ළමයින්ගේ ඉදිරිපත් කිරීම් කෙරෙනවා. විදේශ රටවල්වලදිත් එහෙමයි. ඒ අයට ප්‍රයෝජනවත් වේවි මේ ළමා ගීත එකතුව. එක ගොනුවක් විදියට තියෙන නිසා."

"මිදුලේ වැලි මාලිගාව" සංගත තැටියට හර්ෂණ දිසානායක, සුවී සෙනායා මාලියද්ද, ඌෂා වර්ණී මෙන්ඩිස්, කලා භූමී ගායන වෘන්දය, නදීමාල් පෙරේරා, හර්ෂණ මාධව පෙරේරා, ශ්‍රී ලක්මාල්, ශ්‍යාමිණි කරුණාරත්න, නිරාශා බෝපෙආරච්චි, රුවිනි කෞෂල්‍යා, දිනුලි මෙන්ඩිස් සරිනි දිසානායක, කවීශ විජේසූරිය, හිමාෂ දිසානායක කියන දරු දැරියන්ගේ ගායන ඇතුලත්. ඕස්ට්‍රේලියාවේ මෙල්බන් නුවර ඉංග්‍රීසි කතා කරන පරිසරයක වැඩුන දැරියකගේ ගීයක්ද මව් බිමේ දරුවන්ගේ ගායනා අතරට එක් වීම විශේෂයක්. ඇය සරිනි දිසානායක. ගීතය "කරපිංචා කුරුපංචි".

පද රචකයින් අතරට සෝමරත්න දිසානායන, කුමාරදාස සපුතන්ත්‍රි, සුනිල් ආර්. ගමගේ, අනෝමා විජේවර්ධන, බන්ධුල නානායක්කාරවසම්, යමුනා මාලිනී පෙරේරා, වසන්තා කේ මිහිඳු කුලසූරිය, ආචාර්ය අජන්තා රණසිංහ, සිසිර් දිසානායක සහ කැළුම් ශ්‍රීමාල් එක් වෙනවා.

"ළමයින් වෙනුවෙන් මොනවද කළේ කියලා ආපහු හැරිලා බලනකොට ලොකු සතුටක් ඇති වෙන්නෙ. ඉදිරියටත් හොඳ නිර්මාණ ටිකක් එළියට එන්න තියෙනවා. මහාචාර්ය සුනිල් ආරියරත්න මහත්තයගෙ "අලි කතාව" කියලා චිත්‍රපටියක ඉතාම සුන්දර ළමා ගීත තියෙනවා. සෝමරත්න දිසානායක මහත්මයත් "සවුන්ඩ් ඔෆ් මියුසික්" සිංහලයෙන් කරනවා "සරිගම" කියලා. මේ ගීතවල දර්ශණගත කිරීම් වුණත් ඉතාම ඉහළින් සුන්දරව කෙරිලා තියෙනවා. ඒ නිසා අපේ දරුවන්ට ඉදිරියටත් සුන්දර ළමා නිර්මාණ විඳින්න පුළුවන්. අපි වුණත් මේ ළමා නිර්මාණ කරන්නෙ හරිම සතුටින්." ආචාර්ය රෝහණ වීරසිංහයන් දිග සුසුමක් ඉහළට ගත්තා. ඒ තවත් සතුටු සුසුමක්. ඉතින් "සන්නස" මාසිකයේ "ගී සඳළුව" පාඨකයින් වෙනුවෙන් රෝහණ වීරසිංහයන්ට ස්තූති කළා. තව තවත් සරු නිර්මාණ කරන්න සවිය, දිරිය ලැබේවා ! කියලා පැතුවා.



**මිදුලේ වැලි මාළිගාවෙ**
**සක්විති පදවිය ලබන්න**
**ගල්වැට ළඟ වාඩිවෙලා**
**හඳ පායන හැටි බලන්න**
**සතර දිශා ජයගෙන මම හනික එමී**
**ඔබේ ලොවට සඳ හිරු වී එළිය දෙමී**

**පීනා සිප් සයුරෙ දෙතෙර**
**සියල් සතර දැන පිරිසිඳ**
**ලොවේ අනෙක අවමන් මැද නොසෙල්වෙමී**
**මිනිස් මහිම දෝතින් ගෙන සිනාසෙමී**

**එපා ඔටුනු මග සිරසරට**
**එපා සිහසුනක් හිඳිනට**
**සිනා සි සී මා එන මඟ හිඳිනු මැනේ**
**දුවේ කියා මා අමතන් පියාණනේ**

**මුල් ගැයුම : පේෂලා මෙන්ඩිස්**
**පසු ගැයුම : ඌෂා වර්ණී මෙන්ඩිස්**
**රචනය : කුමාරදාස සපුතන්ත්‍රී**
**සංගීතය : ආචාර්ය රෝහණ වීරසිංහ**

## ශ්‍රී ලාංකික වෙළඳසළ විකිණීමට

**මෙල්බන් උතුරු ප්‍රදේශයේ**
**වසර දොළහකට වැඩි කාලයක්**
**සාර්ථක ලෙස පවත්වාගෙන යන**
**විශාල කීර්තිනාමයක් හිමි**
**ශ්‍රී ලාංකික වෙළඳසල**
**විකිණීමට ඇත**

නිර්ව්‍යාජ ගැණුම්කරුවන් පමණක් විමසන්න

0430 246 884